සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	6	පෙරදිග සංගීතය I -II	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. උතුරු ඉන්දීය සංගීත පද්ධතිය හඳුන්වන තවත් නමක් වන්නේ
(1) කර්ණාටක (2) අපරදිග (3) හින්දුස්ථානී (4) බටහිර

2. නූර්ති ගී සඳහා පාදක කරගත් සංගීත පද්ධතිය වන්නේ
(1) හින්දුස්ථානී (2) අපරදිග (3) කර්ණාටක (4) බටහිර

3. නර්ථන විෂයේ මාධ්‍ය වන්නේ මින් කුමක්ද?
(1) නාද (2) අභිනය (3) අංග චලන (4) වර්ණ

4. ගාන්ධාරය හා නිශාදය යන ස්වර බටහිර සංගීතයේදී නම් කරන්නේ පිළිවෙළින්
(1) E,G (2) B, G (3) E, A (4) E, B

5. ස, රි, ග, ම යන ස්වර පමණක් යෙදෙන ස්වර ස්ථාපන ගීතය තෝරන්න.
(1) කඳුපෙළ අතරේ තුරුවදුලේ (2) එකට සතුටු සාගරේ
(3) කඳු කඳු නැගෙනා (4) බැතිනා සිරිපා කරුණා කරනා

6. සරිසග, රිගරිම ..... යන ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර වන්නේ
(1) ගමපග (2) ගමගප (3) ගපමග (4) මපමධ

7. ස්වර පුවරු වාදන භාණ්ඩයක් නොවන්නේ මින් කුමක්ද?
(1) මෙලෝඩිකාව (2) සර්පිනාව (3) ගිටාරය (4) විදුලි ඕගනය

8. තත් 6 ක් හා තත් 4ක් පිහිටන භාණ්ඩ යුගලය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ
(1) සිතාරය, වයලීනය (2) මැන්ඩලීනය, වයලීනය
(3) වයලීනය, එස්රාජය (4) ගිටාරය, වයලීනය

9. සුවඳ පත්ම ඕලු ආදී ගීතය ඇතුළත් නූර්ති නාට්‍යය කුමක් ද?
(1) වෙස්සන්තර (2) විදුර (3) දුටුගැමුණු (4) පද්මාවතී

10. "ඉරෙන් හඳෙන් එළිය අරන් " යන ගීතය ඇතුළත් චිත්‍රපටය වන්නේ,
(1) සිරි පැරකුම් ය. (2) සූරිය අරණ ය. (3) සරිගම ය. (4) තාල ය.

Past Papers Wiki

■ **ප්‍රශ්න අංක 11-15 දක්වා A කොටසේ අදහසට වඩාත් ගැළපෙන ප්‍රකාශය B කොටසින් තෝරා යා කරන්න.**

A	B
11. බුද්ධං සරණේ සිරස දරාගෙන	එළුවන් කෑම ක්‍රීඩාවේ ගීයකි
12. සාර සදිසි පෙති පේර නෙලන කල	ළමා ගීයකි
13. මේ වැල මොකදෝ දම්වැල	තුන්සරණේ ගීයකි
14. සෙන්පතියන් ගැන නැවුපතියන් ගැන	නූර්ති ගීයකි
15. අද වෙස්සන්තර රාජ පුතා	මේවර කෙළියේ ගීයකි

■ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

16. වයලීනය ..... නම් උපකරණයෙන් වාදනය කරයි.

17. නරිබෑණා නාට්‍යයේ නිෂ්පාදකවරයා ..... මහතා ය.

18. දුටුගැමුණු නූර්තියේ රචකයා ..... මහතා ය.

19. ගීතයක් ප්‍රස්තාර කිරීමේදී කෙටි අකුරක් සමග හල් අකුරක් යෙදෙන විට (උදා : මල්)
එය ..... අක්ෂරයක් ලෙස හඳුන්වයි.

20. සිතාරය වාදනය කරනු ලබන්නේ ..... නම් උපකරණයෙනි.

(ජෝන් ද සිල්වා / මිශ්‍රාබය / පික් / දයානන්ද ගුණවර්ධන / අලුව / ගුරු / ලඝු)

Past Papers Wiki

II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න.**

01. (i) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

ස්වරය	ස්වරනාමය
ස	සඩ්ජය
රි	
ග	
ම	
ප	
ධ	
නි	

(ii) ඔබ කැමති ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක ගී පද ප්‍රස්තාර කර දක්වන්න.

02. පහත දැක්වෙන වාදන භාණ්ඩ අතරින් 2ක් තෝරාගෙන එකකට කරුණු 05 ක් බැගින් ලියන්න.

වයලීනය ගිටාරය සිතාරය
බටනලාව තබ්ලාව මැන්ඩලීනය

03. (i) ඔබ දන්නා ළමා ගීත 4ක් නම් කරන්න.

(ii) ඉන් එක ගීතයක මුල් කොටස ලියා එම ගීතය ගයන ගායකයා හෝ ගායිකාව නම් කරන්න.

04. (i) පහත දැක්වෙන ගී පාදයේ ලඝු, ගුරු, ප්ලුත මාත්‍රා සලකුණු කරන්න.

පාන්දරින් හිරු පායා

(ii) ඒ අනුව ඉහත ගී කොටසේ ඇති ලඝු, ගුරු, ප්ලුත මාත්‍රා සංඛ්‍යාව වෙන වෙනම ලියා දක්වන්න.

05. (i) ඔබ දන්නා නෘර්ති ගීයක මුල් කොටස ලියන්න.

(ii) ඔබ ලියූ ගීතය ඇතුළත් නෘර්තිය හා එහි රචකයා නම් කරන්න.

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank